ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විගමනිකයින්ගේ පැමිණිලි සමථයකට පත් කිරීම සඳහා රැකියා නියෝජිතායතන විසින් 2010 හා 2011 වර්ෂවලට අදාලව කාර්යාංශයේ රු.258,832 ක් තැන්පත් කර තිබුණි. එම මුදල ජර්නල් සටහන් මඟින් විගමනිකයින්ගේ පැමිණිලි සමථයකට පත්කිරීමේ වියදම් ගිණුමට බැරකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

### 1.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම් විස්තරය | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශේෂය | ඒකාබද්ධ උපලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආපදා ණය ශේෂය | 155,216,941 | 155,213,838 | 3,108 |
| වාහන ණය ශේෂය | 83,358,631 | 83,405,346 | 46,715 |
| ඒජන්සි ණයහිමියෝ | 215,943,664 | 223,590,871 | 7,647,207 |
| පහසුකම් සැපයීමේ ගාස්තු | 56,818,485 | 56,673,000 | 145,485 |
| කම්කරු ගිවිසුම් ගාස්තු (දූත මණ්ඩල) | 1,446,958,337 | 1,446,843,893 | 114,444 |

### 1.2.3. අවිනිශ්චිත ගිණුම්

විවිධ ණයහිමියන් යටතේ රු.148,865 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් වූ අතර එය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගමනිකයින්ගේ පැමිණිලි සමථයකට පත්කිරීම තීරණය කිරීමේදී අදාළ රැකියා නියෝජිතායතන විසින් කාර්යාංශයේ තැන්පත් කරන මුදල් අදාල විගමනිකයන්ට කාලීනව නොගෙවා කාර්යාංශය විසින් රඳවාගෙන තිබුණි. 2008 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා එසේ රඳවාගෙන තිබූ මුදල රු.13,741,167 ක් විය.

(ආ) 2003 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් අයකර මහා භාණ්ඩාගාරය හරහා 2003 වර්ෂයේ සිට කාර්යාංශයට ලැබිය යුතුව තිබූ එකතුව රු.2,596,463,468 ක් වූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තුවලින් රු.1,446,843,893 ක මුදලක් කාර්යාංශය වෙත ලැබිය යුතුව තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රක්ෂණ වන්දි ලෙස ලද මුදල්වලින් රු.3,629,174 ක මුදලක් අදාළ විගමනික ශ්‍රමිකයින්ට නොගෙවා ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි.

(ඇ) 1990 වර්ෂයේ දී ඉරාකය විසින් කුවේට් ආක්‍රමණය කිරීම නිසා එහි රැකියාවන්හි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට සිදු වූ ආපදාවන්ට වන්දි ගෙවීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසමෙන් ලැබුණු මුදල් ඔවුන් වෙත ගෙවන තෙක් තාවකාලික තැන්පත්වල රඳවා තිබුණි. එම තැන්පත් වෙනුවෙන් අදාල කාල සීමාවන් තුළ දී උපයා ගත් පොළී මුදල්ද එම අරමුදලට බැරව තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.2,431,078,149 ක ශේෂයක් පැවතුණි. එම මුදල් නිරවුල් කිරීමට හෝ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හෝ සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ඉ) කාර්යාංශය විසින් විවිධ ආයතන වෙත රු.6,195,396 ක් තැන්පත් කර තිබුණු අතර, ඒවා අයකර ගැනීම සම්බන්ධව කටයුතු කර නොතිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 167,358 |
| වෙනත් ලැබිය යුතු දෑ | 642,875 |
| ඉතාලියේ ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 887,610 |
| විවිධ තැන්පතු | 4,497,553 |
| | 6,195,396 |

(ඊ) නිලධාරීන් 18 දෙනෙකුගෙන් හිඟ හිටි රු.4,918,736 ක ආපදා හා වාහන ණය ශේෂ මාස 05 ත් 60 ත් අතර කාල පරාසයක් තුල අය කර නොතිබුණි.

**1.2.5. විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| විවිධ තැන්පතු | - හර | 167,358 | (අ) විවිධ තැන්පතු |
| | - බැර | 26,832,000 | (ආ) තැන්පතු කුවිතාන්සි |
| විවිධ ණය හිමියෝ | | **74,059,860** | (අ) විස්තරාත්මක උපලේඛනය<br>(ආ) ශේෂ සනාථ කිරීම් |

**1.2.6. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1985 අංක 21 දරන විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 15 වගන්තිය | කාර්යාංශයේ අරමුණ විදේශ ශ්‍රම වෙළඳපල තුළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට ඉහල රැකියා අවස්ථා වර්ධනය කිරීම සඳහා කටයුතු සැලසීම වුවත්, ඊට පටහැනිව වොලිබෝල් ක්‍රීඩාව නඟා සිටුවීම සඳහා රු.1,000,000 ක මුදලක් වියදම් කර තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| (i) මු.රෙ. 371 (2) | අවස්ථා 31කදී ගෙවා තිබුණු එකතුව රු.3,645,507 ක් වූ අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණු අතර, සමහර නිලධාරීන් වෙත නිකුත් කළ අත්තිකාරම් පියවීමට වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. |
| (ii) මු.රෙ.756 | සෝල් තානාපති කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන විදේශ සේවා නියුක්ති කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii). මු.රෙ.1646 | කාර්යාංශයේ සියළුම සංචිත වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**1.2.7. ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**-----------------------------------------------------------**

ජපානයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශය සඳහා කම්කරු සුභසාධන නිලධාරී තනතුරක් අනුමත කර නොතිබුණත් 2012 වර්ෂය සඳහා එම අනුමත නොවූ තනතුර සඳහා කාර්යාංශයෙන් අනුයුක්ත කරනු ලැබූ නිලධාරියෙකු වෙනුවෙන් රු.5,103,405 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ හා පරිපාලිතයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය ආදායම් බදුවලට පෙර රු.258,895,523 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.598,382,192 ක අතිරික්තයක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.339,486,669 ක් හෙවත් සියයට 57 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සේවක සුභසාධන අරමුදලේ වියදම්, මෙහෙයුම් වියදම්, පරිපාලන වියදම් හා වෙළඳ ප්‍රවර්ධන වියදම් පිළිවෙලින් රු.268,054,910 කින්, රු.52,940,739 කින්, රු.30,604,247 කින් හා රු.27,660,538 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි

කාර්යාංශයට එරෙහිව 2012 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් විසින් නඩු 11 ක් ගොනු කර තිබුණු අතර කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන් වෙත නඩු 303 ක් පවරා තිබුණි.

### 2.3 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් පිළිබඳ විග්‍රහයේ දී පහත සඳහන් පරිදි සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ වියදම් අතර අසාමාන්‍ය වැඩිවීමක් නිරීක්ෂණය විය.

| වියදම් වර්ගය | 2012 | 2011 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වෙළඳ ප්‍රවර්ධන - විදේශ | | | | |
| දූත මණ්ඩල කාර්යාලවල | 49,357,705 | 17,857,135 | 31,500,570 | 176 |
| සම්මන්ත්‍රණ හා වැඩමුළු | 8,474,920 | 2,576,038 | 5,898,882 | 229 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෘහ සේවයේ යෙදෙන්නන් විසින් ඔවුන්ට සිදුවන අපහසුතා පිළිබඳ පැමිණිලි කිරීම සඳහා කාර්යාංශයේ පැමිණිලි විසඳීමේ අංශයක් පවත්වා තිබුණි. එම අංශයට ලැබෙන පැමිණිලි විමර්ශනය කර පැහැදිලි විසඳුම් ලබා දී ඒවා නිරාකරණය කිරීමෙන් පසු අදාල ගොනුවල වැඩ අවසන් කළයුතුය. ලැබී තිබුණු පැමිණිලි වෙනුවෙන් නිසි විසඳුම් ලබා දී නොමැතිව, දුරකථන ඇමතුම් මඟින් අදාල පැමිණිල්ල ඉල්ලා අස්කර ගත් බව සඳහන් කර විධිමත් නොවූ ලිපි මඟින් පැමිණිල්ල නිරාකරණය කළ බවට ගොනුවල සටහන් තබා වැඩ කටයුතු අවසන් කර තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

(ආ) 2012 වර්ෂයේ සේවක සුභසාධන ක්‍රියාකාරකම් පිළිබඳ කාර්ය සාධන වාර්තාවට අනුව ප්‍රගතිය පහත දැක්වේ.

(i) අධ්‍යාපනය අතරමඟ නතරවන විගමනිකයින්ගේ දරුවන්හට වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලබා ගැනීමට මූල්‍යමය හා උපදේශන සේවාවක් ලබා දීම සඳහා ළමුන් 500ක ඉලක්කයක් 2012 වර්ෂයේදී දියත් කර තිබුණත් පුහුණුවීම් සඳහා ළමුන් 16 දෙනෙකුට පමණක් මූල්‍ය ආධාර ලබා දී තිබුණි.

(ii) විදේශ රැකියාවේදී සිදුවන අනතුරක් නිසා පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව මෙරටට පැමිණි විගමනිකයින්ගේ ආදායම් තත්ත්වය දියුණු කර ගැනීම සඳහා ස්වයං රැකියා මඟින් ආදායම් උත්පාදනය කර ගැනීමේ අරමුණින් එවැනි පුද්ගලයින් 50 දෙනෙකුට ආධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 1.3ක් 2012 වර්ෂයේ ඇස්තමේන්තුගත කර තිබුණි . සමාලෝචිත වර්ෂයේදී ආබාධිතයන් දෙදෙනෙකුට පමණක් ස්වයං රැකියා ආධාර ලබා දී තිබුණි.

(ඇ) විගමනිකයින් වෙනුවෙන් කතරගම සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා අක්කර 1 රූඩ් 0 පර්චස් 19.5 ක රජය සතු ඉඩමක් 1997 අගෝස්තු 11 දින කාර්යාංශය වෙත ලබා දී තිබුණි. 2012 වර්ෂය අවසාන වන විට එම ඉදිකිරීමට අදාල සැලැස්ම රේඛීය අමාත්‍යාංශයට යැවීම හා ඉඩමෙහි පස් පරීක්ෂාව සඳහා ලංසු කැඳවීම පමණක් සිදුකර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 වර්ෂයේ තානාපති කාර්යාල මඟින් උපයාගත යුතු ආදායම ලෙස රුපියල් මිලියන 340 ක් තක්සේරු කර තිබුණත් රැස්කර තිබුණු රුපියල් මිලියන 629 ක ආදායමින් ආපසු ගෙවන හා නොගෙවන සේවාදායකයින්ගේ තැන්පත් හා ආරක්ෂිත නිවාස තැන්පත්වල එකතුව රුපියල් මිලියන 345 ක් අඩුකළ විට රුපියල් මිලියන 284 ක තථ්‍ය ආදායමක් උපයාගෙන තිබුණු අතර රුපියල් මිලියන 56 ක් හෙවත් ඇස්තමේන්තුගත මුළු ආදායමින් සියයට 16 ක් රැස්කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම තානාපති කාර්යාල මට්ටමින්ද ආදායම් ඉලක්කයන්ට ළඟා නොවීම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| තානාපති කාර්යාලය | තක්සේරු කළ ආදායම | තථ්‍ය ආදායම | විචලනය | |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | සියයට |
| ජෙඩා | 16 | 05 | 11 | 69 |
| ලෙබනන් | 20 | 11 | 09 | 45 |
| කටාර් | 110 | 64 | 46 | 42 |
| අබුඩාබි | 16 | 10 | 06 | 38 |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සහන රක්ෂණ අරමුදලේ වන්දි ගෙවීමේ කොන්දේසි 1.1 ඡේදයට අනුව විදේශ රැකියාවකට ගොස් අතිශයින් හිරිහැරයට ලක්වූවන් ආපසු මෙරටට ගෙන්වීමේ වැඩපිළිවෙල යටතේ ගුවන් ටිකට්පත් ගාස්තු, අරමුදල මඟින් දරනු ලැබිය යුතුය.

සමාලෝචිත වර්ෂයේදී අතිශයින් හිරිහැරයට ලක්වූ විගමනිකයින් 524 දෙනෙකුගේ එකතුව රු.18,348,183 ක ගුවන් ටිකට්පත් ගාස්තු සේවක සුභසාධන අරමුදලින් ගෙවා තිබුණු අතර රක්ෂණ අරමුදලින් ආවරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාංශය විසින් අයකරනු ලබන ලියාපදිංචි ගාස්තු හා කොරියන් පුහුණු ගාස්තු නිවැරදිව රැස්කිරීම හා ගිණුම්ගත කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) රියාද්,කුවේට්,ජෙඩා,ජෝර්දාන්,කටාර්,ඕමාන් හා ලෙබනන් යන මැදපෙරදිග රටවල පිහිටුවා ඇති රැකියා නියෝජිත ආයතන මගින් එරට සිටින හාම්පුතුන්ගේ රැකියා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවේ විදේශ රැකියා නියෝජිත ආයතන මගින් සපයා ගෙන තිබුණි. එහිදි හාම්පුතුන් පිළිබඳවත් ශ්‍රමිකයින් පිළිබඳවත් නියෝජිත ආයතන විසින් නිසි ඇගයීමක් සිදුකර රැකියා අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විධිමත් වැඩපිළිවෙලක් කාර්යාංශය විසින් දියත්කර නොතිබුණි. මේ නිසා 2012 වර්ෂයේදී සේවා කාලය අවසන් වීමට ප්‍රථම ශ්‍රමිකයින් 1428 දෙනෙකු නැවත ගෙන්වා ගැනීමටත්, දූත මණ්ඩල ආරක්ෂිත නිවාසවල විගමනිකයින් 671 ක් රැඳී සිටීමත්, වලක්වා ගැනීමට නොහැකිවී තිබුණි. එමෙන්ම විගමනිකයින්ගෙන් ලැබී තිබුණ 12681 ක් වූ පැමිණිලි සංඛ්‍යාව ද, එරට සිරගතව සිටින විගමනිකයින් 202 ක ප්‍රමාණයද අවම මට්ටමක පවත්වාගෙන යාමටද නොහැකිවී තිබුණි.

(ඈ) ජාත්‍යන්තර සංක්‍රමණික දිනය වෙනුවෙන් රු.26,466,500 ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණු අතර එම ඇස්තමේන්තුගත වියදම ඉක්මවා රු.1,182,381 ක් වැයකර තිබුණි. ටී ෂර්ට්, හිස් වැසුම්, කුඩ යනාදිය මිලදී ගැනීම, දැන්වීම් පත්‍රිකා හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම, උත්සව ශාලා වියදම් සහ ලොරි රථ සැරසීම් යනාදියට ඉන් රු.24,079,633 ක් වැයකර තිබුණි.

(ඉ) විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත මඟින් විදේශ රැකියා නියුක්ති නියෝජිතායතනවලට බලපත්‍ර නිකුත් කිරීම, බලපත්‍රලාභියාට තිබිය යුතු සුදුසුකම් තීරණය කිරීම, ඇප තැන්පතු නියම කිරීම, බලපත්‍ර අළුත් කිරීම, අවලංගු කිරීම සඳහා කාර්යාංශයට බලතල ලබා දී තිබුණි. ඒ තුළින් බලපත්‍රලාභින් සඳහා ඉහළ

පාලනයක් හා විගමනික ශ්‍රමිකයන් ආරක්ෂා කිරිම පනත මඟින් ලබා දී තිබුණද පනතේ ප්‍රතිපාදනයන්ට පරිබාහිරව කාර්යාංශය විසින් රු.5,000 ක් වැනි මුදලකට විදේශ රැකියා ප්‍රවර්ධන සහකරුවන් ලියාපදිංචි කිරිමේ ක්‍රමවේදයක් 2012 වර්ෂයේ සිට ආරම්භ කර තිබුණි. ඒ අනුව විදේශ රැකියා ප්‍රවර්ධන සහකරුවන් ලියාපදිංචිය සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්, ග්‍රාමනිලධාරි සහතිකය හා දිවුරුම් ප්‍රකාශය පමණක් සලකා බලා රැකියා ප්‍රවර්ධන සහකරුවන් 434 දෙනෙකු ලියාපදිංචි කර තිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා විදේශ රැකියා නියෝජිත ආයතන ලියාපදිංචිවීම ඉල්ලුම් කර රු.3,460,000 ක් වූ බලපත්‍ර ගාස්තු ලැබී තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ආයතන ලියාපදිංචි කර හෝ එසේ කළ නොහැකි නම් එම මුදල් ආපසු ගෙවිමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.4** හඳුනා ගත් පාඩු

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ නිලධාරින් විසින් 2012 සැප්තැම්බර් 02 සිට 09 දක්වා ඉතාලි සංචාරයක් සැලසුම් කර තිබුණි. එම සංචාරය 2012 සැප්තැම්බර් 09 සිට 16 දක්වා කල් දැමීම හේතුවෙන් ටිකට්පත් අවලංගු කිරීමේ හා නැවත රක්ෂණ ලබා ගැනීමේ ගාස්තු ලෙස රු.32,342 ක අමතර මුදලක් වැය කර තිබුණි.

(ආ) කාර්යාංශය විසින් විදේශ සේවා අභ්‍යාස ආයතනයක් ඉදිකිරිම සඳහා මතුගම ප්‍රාදේශිය සභාවට අයත් අක්කර 4 ක භූමි ප්‍රමාණයක් 2003 සැප්තැම්බර් 03 දින සිට අවුරුදු 30ක බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබුණි. වසර 5න් 5ට ගෙවිය යුතු රු.380,000 ක් වූ වාර්ෂික බදු මුදල 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වර්ෂ 5ක් සඳහා වූ කාලපරිච්ඡේදයට ගෙවීමට අපොහොසත් වීමෙන් වසර 3ක ප්‍රමාද ගාස්තු ලෙස සියයට 30 ක දඩ මුදලක් වූ රු.342,000 ක් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

## 3.5 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා හෝමාගම පිටිපන ප්‍රදේශයේ අක්කර 05 ක ඉඩමක් අවුරුදු 50 ක බදු පදනම මත ලබා දීමට 2010 නොවැම්බර් 03 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණය කර තිබුණි. 2010 ජනවාරි 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු කමිටුව විසින් එය රුපියල් මිලියන 52 කට තක්සේරු කර තිබුණි. 2010 පෙබරවාරි 26 දින එම වටිනාකමින් සියයට 50 ක් හෙවත් රුපියල් මිලියන 26 ක් කාර්යාංශය මඟින් ගෙවා තිබුණු අතර 2010 මාර්තු 04 දිනැති අංක 10/08/2426 දරන ගිවිසුමෙන් ඉඩමෙහි භෞතික අයිතිය කාර්යාංශය වෙත පවරා තිබුණි. එසේම ඉඩම සඳහා ඉතිරි මුදල ගෙවන ලෙසට අධිකාරිය විසින් 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 5/5/10/1/11/3/ Pro 21V දරන ලිපිය මඟින් දන්වා තිබුණි. නමුත් මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොකර සියයට 50 ක ගෙවීම් සිදුකර තිබුණු අතර කාර්යාංශය විසින් 2013 මැයි 14 දින දක්වාම එම ඉඩම අදාල කාර්යය සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පිර්ඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාර රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් රේඛීය අමාත්‍යාංශය විසින් පාවිච්චි නොකළ යුතු වුවද, කාර්යාංශයට අයත් හා කුළියට ගන්නාලද වාහන 06ක් අමාත්‍යාංශය හා ජනාධිපති කාර්යාලය විසින් පාවිච්චි කරමින් පැවතුණු අතර ඒ සඳහා කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.4,459,024 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) යථෝක්ත චක්‍රලේඛයට පටහැනිව කාර්යාංශයේ නිලධාරීන් හතර දෙනෙක් අමාත්‍යාංශයේ හා අනෙකුත් ආයතනවල සේවයේ යොදවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ රු.2,085,345 ක් කාර්යාංශය විසින් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබූ අතර එසේම විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවස්ථා 09 කට අදාල එකතුව රු.839,266 ක් කාර්යාංශය විසින් වැයකර තිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට කාර්යාංශයට අදාල කාර්යය මණ්ඩල විස්තර පහත සඳහන් පරිදි වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 237 | 257 | 20 | - |
| මාණ්ඩලික නොවන | 472 | 541 | 69 | - |
| සුළු සේවක | 178 | 133 | - | 45 |
| එකතුව | 887 | 931 | 89 | 45 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 සැප්තැම්බර් 06 දිනැති අංක DMS/E4/46/4/27/274/1දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට අනුව කාර්යාංශය සඳහා තනතුරු 24 ක් වෙනුවෙන් 887ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණු අතර 931 ක සේවක සංඛ්‍යාවක් බඳවාගෙන තිබුණි. ඉන් කොන්ත්‍රාත්, ද්විතීයික හා පැවරුම් පදනම් මත බඳවාගත් සංඛ්‍යාව පිළිවෙලින් 83,15 හා 03 දෙනෙකුගෙන් සමන්විත විය.

(ආ) අනුමත නොවූ තනතුරු 09ක් සඳහා නිලධාරින් 17 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා රු.7,238,789 ක් 2012 වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

**3.8 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාංශය සතු වාහන 57 ක් තිබුණු අතර එයින් සංචිත වාහන 31 ක් විය. 2012 ජනවාරි මස සිට දෙසැම්බර් 31 දින දක්වා කාර්යාංශයේ දෛනික ධාවන අවශ්‍යතා සඳහා කාර්යාංශය සතු වාහන විධිමත් පරිදි භාවිතා නොකර කුලී වාහන වෙනුවෙන් විවිධ ආයතනවලට රු.14,038,184 ක් ගෙවා තිබුණි.

(ආ) 2008 ජූලි 28 දිනැති අංක පීඊඩී - 50 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව කාර්යාංශයේ නිලධාරීන් විසින් විධිමත් අනුමැතියකින් තොරව සීමාව ඉක්මවා අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳව 2012 ජනවාරි 13 සිට 15 දක්වා කාර්යාංශයේ ඉහල කළමනාකාරිත්වය සහ අමාත්‍යාංශ නිලධාරින් සඳහා නේවාසික වැඩමුළුවක් පැවැත්වීම වෙනුවෙන් රු.1,769,315 ක් වැය කර තිබුණි. එසේ පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම වරින් වර සංශෝධනය කර තිබු අතර, 2012 වර්ෂයට අදාල සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ගිණුම් වර්ෂය අවසාන වූ පසු 2013 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු අඩුපාඩු වරින් වර කාර්යාංශයේ සභාපතිවරයා වෙත දන්වා යවන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වාහන පාලනය

(ඇ) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු ක්‍රමවත් කිරීම හා පාලනය කිරීම.

(ඈ) ආදායම් රැස්කිරීම.

(ඉ) වත්කම් පාලනය.